www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික පරිහානිය සහ සමාජවාදය සඳහා ඇති අවකාශ

## The historic decline of US imperialism and the prospects for socialism

**නික් බීම්ස් විසිනි**

**2005 පෙබරවාරි 03**

### තුන් වන කොටස

*ජනවාරි 29-30 සති අන්තයේ දී, සමාජවාදී සමානතා පක්ෂය (සසප) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවැත්වී ය. පහත පල කරන්නේ ඕස්ට්‍රේලියාවේ සසප ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික නික් බීම්ස් ඉදිරිපත් කල ආරම්භක වාර්තාවේ තුන්වැනි කොටස යි. අවසාන කොටස ඉදිරියේ දී පල කෙරෙනු ඇත.*

සමස්ත ලෝකයට ම නිදහස හා විමුක්තිය ප්‍රකාශ කල බුෂ්ගේ දෙවැනි සමාරම්භක කථාව, පලමු වැනි ලෝක සංග්‍රාම අවධියේ දී වුඩ්රෝ විල්සන්ගේ සමහර පම්පෝරි කථා සිහිගන්වයි. එනමුදු අවම වසයෙන් ඇමරිකානු සියවස යයි කිව හැකිව තිබූ එක් අවධියක, යම් විශ්වාසයකින් යුක්තව හා යුරෝපීය ජනගහනයේ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය ඇතිව විල්සන් කථා කලේ ය යන වැදගත් වෙනස්කම සහිතව යමෙකු එය කිව යුතුව ඇත. ''ලොව අඳුරුම අහුමුලුවලට වැදී'', ''එහි ප්‍රගතියට එරෙහිව සටන් වදින්නවුන්'' දවා ලන ලෙස ''හීලෑ නොකරන ලද නිදහසේ ගිනි දැල්'' වලින් මහත් ඕනෑකමින් අයැද සිටින විට බුෂ් කතා කරන්නේ වටලනු ලැබූ පාලන තන්ත්‍රයක නායකයකු ලෙසිනි. එහෙත් දෙදෙනා අතර යට සඳහන් එකමුතුව පවතියි. බුෂ් හා විල්සන් යන දෙදෙනා ම නිදහස අයැදීමේ අර්ථය, සියල්ලටමත් වඩා, ඇමරිකානු ප්‍රාග්ධනයට ඕනෑම තැනකට ඇතුලුවීමටත්, සෑම තැනකටම කාවැදීමටත්, ලෝකයේ ඕනෑම ප්‍රදේශයකින් ලාභ මිරිකා ගැනීමටත් ඇති නිදහස යි.

විල්සන්ගේ නායකත්වයෙන් ඇමරිකාව ප්‍රථම ලෝක යුද්ධයට අවතීර්න වූයේ, එක්සත් ජනපදයේ ගතිකමය ආර්ථික ප්‍රසාරනයේ තල්ලුවෙනි. එවක දී එක්සත් ජනපද ආර්ථිකය, සමස්තයක් ලෙස ජාත්‍යන්තර ආර්ථිකය මත රඳා පැවැත්ම වේගවත් වෙමින් තිබුනි. එහි කර්මාන්ත කොතෙක් දුර ප්‍රසාරනය වී තිබුනේ ද යත්, 1912 සිය මැතිවරන ව්‍යාපාරය තුල දී විල්සන් පැහැදිලි කලේ ''ලෝක වෙලඳපොල තුලට නිදහස් ප්‍රවිශ්ඨයක් සොයා නො ගත හොත්, ඒවා එහි කබා ඉරාගනු ඇත'' යනුවෙනි. දේශීය වෙලඳපොල තවදුරටත් සෑහෙන්නේ නැතැයි ද ඇමරිකාවට විදේශ වෙලඳපොලවල් අවශ්‍ය යයි ද ඔහු අවධාරනය කලේ ය. සත්තකින් ම යුද්ධයේ ඉල්ලීම්, එක්සත් ජනපදය නයකාර ජාතියක සිට නයහිමි ජාතියක් බවට පරිවර්තනය කරමින්, මෙම වෙලඳපොලවල් සපයා දීමට උදව් විය.

1912 ජනාධිපතිවරන ව්‍යාපාරයේ ඔහුගේ කථාවන්හි අඛන්ඩ තේමාව වූයේ අපනයනයන් ඉහල දමා නො ගත හොත් ඇමරිකානු ආර්ථිකය, අවපාතයෙන් ද එක තැන පල්වීමෙන් ද පීඩාවට පත් විය හැකි බව යි. මැතිවරන ව්‍යාපාරය ආරම්භයේ දී ම වර්ජිනියා මහා සමුලුවට ඔහු කියා සිටියේ ''අපට පරිභෝජනය කල නොහැකි තරම් කාර්මික භාන්ඩ සම්භාරයක් අපි නිපදවන්නෙමු. දැන් අප ආර්ථික වසයෙන් හිර නොවී සිටීමට නම් ලෝකයේ මහා ජාත්‍යන්තර හුවමාරුව කරා මාවතක් සොයා ගත යුතුව තිබේ. [බලන්න එන්. ගෝර්ඩන් ලෙවින්, *Woodraw Wilson and World Politics*, (වුඩ්රෝ විල්සන් හා ලෝක දේශපාලනය) - පිටු14]

විල්සන් ඔහුගේ ප්‍රථම නිල කාලයේ අවසන් දිනවල ඩෙට්‍රොයිට් හි අලෙවිකරුවන්ගේ රැස්වීමක් අමතා ඇමරිකානු ප්‍රසාරනයේ අවශ්‍යතාව පිලිබඳව ඔහුගේ අදහස් මෙසේ ගෙනහැර පෑවේ ය.

''ඉතින් මගේ මිත්‍රවරුනි, මම ඔබ වෙත ගෙන එන සරල පනිවිඩය නම් මෙය යි. ව්‍යාපාරයේ ක්ෂිතිජය වෙත ඔබේ දෑස් යොමු කරන්න. ඔබ උනන්දුවන සොච්චම් ක්‍රියාවලීන් වෙත පමනක් ඇස ගසා නොසිටින්න. ඔබගේ සිතුම් පැතුම් හා බලාපොරොත්තු සමස්ත ලෝකයම සිසාරා විදේශයන් වෙත යොමු කරන්න. ඔබ යන සෑම තැනකට ම, මනුෂ්‍යත්වයේ මූලධර්ම, විමුක්තිය හා නිදහස රැගෙන යාමට ඇමරිකානුවන් අධිෂ්ඨාන කර ගෙන සිටින්නේ ය යන සිතුවිල්ලේ උද්යෝගය සමග යන්න. බඩු විකුනන්න. එය ලෝකය වඩා සුවපහසු හා වඩා ප්‍රීතිමත් තැනක් කරනු ඇති අතර ඔවුන් ඇමරිකානු මූලධර්ම කරා යොමු කරන්න.'' (එම පිටු18)

විල්සන්, භූගෝලීය ප්‍රසාරනයේ සිය ඉදිරිදර්ශනය ප්‍රචාරය කලේ, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම හා විවෘත සාකච්ඡා මගින් මහා බලවතුන් අතර රහස් ගිවිසුම් හා කුමන්ත්‍රන විස්ථාපනය කෙරෙන, ''ප්‍රජාතන්ත්‍රවාදයේ'' සහ ''නව රාජ්‍යතාන්ත්‍රිකතාවයේ'' නාමය යටතේ ය. විල්සන්ට ඔහුගේ ''පරමාදර්ශවාදය'' නිසා පහර දෙනු ලැබින. එහෙත් එක් ඉතිහාසඥයෙක් මෑත කාලයේ සඳහන් කල පරිදි මෙම චෝදනාවන් කාරනය මඟහැරගෙන තිබේ. ''විල්සන්ගේ කයිවාරු 'පරමාදර්ශවාදයම' වඩාත් 'යථාර්ථවාදී' හා පක්ෂග්‍රාහී කාරනා සම්බන්ධයෙන් යොදා ගත් රුදුරු දේශපාලන අවියක් විය. විල්සන්ගේ කේන්ද්‍රීය ප්‍රාර්ථනාව නිදහස් ආර්ථික ප්‍රවිශ්ඨයක් සම්පාදනය කරන ලිබරල් ධනේශ්වර ලෝක පර්යායක් ගොඩ නැංවීමට නොඅඩු දෙයක් නො වී ය. බැලූ බැල්මට උදාරම් බවක් පෙනී ගියද, වෙලඳ මාර්ගවල හා වෙලඳපලවල ආධිපත්‍යය දරා සිටි සමයේ මෙම ඊනියා නිදහස් වෙලඳාමෙන් බ්‍රිතාන්‍ය ප්‍රතිලාභ අත්පත් කර ගත් තරමට ම, මතුවෙමින් පවත්නා තම ආර්ථික ආධිපත්‍යය හේතුවෙන් මෙහි ප්‍රධාන ප්‍රතිලාභියා වන්නේ එක්සත් ජනපදය බැව් ඔහු හොඳින් අවබෝධ කරගෙන සිටියේ ය. පැරිස් සාම සමුලුවේ දී ඇමරිකානු සියවස නිර්මානය කිරීමේ පලමු මොහොත ඉස්මත්තට පැමිනියේ ය.'' [නීල් ස්මිත්, *American Empire*, (ඇමරිකානු අධිරාජ්‍යය), 140 පිටුව]

එක් ගැටලුවක් පැවතුනි. ඒ ඇමරිකාව ගෝලීය ආධිපත්‍යය දැරීමට ලකලෑස්ති වන විට ම, රුසියානු විප්ලවයේ රූපයෙන් ලෝක ධනවාදය පෙරලා දැමීම නිවේදනය කර තිබීම යි.

එක්සත් ජනපදයේ ද අනෙකුත් ධනේශ්වර බලවතුන්ගේ ද දැඩි පරිශ්‍රමයන් මධ්‍යයේ වුව ද විප්ලවය පෙරලා දැමීමට නොහැකි වූ අතර යුරෝපීය පාලන තන්ත්‍රයන් බලගතුව පැලපදියම්ව සිටිය දී, නිෂ්පාදනයේ ජව සම්පන්න ප්‍රසාරනය සඳහා ලෝක ආර්ථිකය යලි ගොඩනැගීමේ බලපෑමක් කිරීමට එක්සත් ජනපදය අසමත් විය. තවද එක්සත් ජනපදය බලගතු ලෙස පෙරට තල්ලු වූයේ නම්, බිඳෙනසුලු යුරෝපීය පර්යාය අස්ථාවර කිරීමේ අවදානම ද, බොල්ෂෙවික්වාදයේ ව්‍යාප්තියට මඟ විවර කිරීම ද, එමගින් සිදු විය හැකිව තිබුනි. එහි ප්‍රතිවිපාක වසයෙන් පැරිස් සාම සම්මුතිය ආර්ථික හෝ දේශපාලන සම්මුතියේ අව්‍යාජ ප්‍රතිසංස්කරනයක් ගෙන නො ආවේ ය. කේන්ස් පෙන්වාදුන් පරිදි වර්සේල්ස් සම්මුතිය යම් ආකාරයක ආර්ථික පිස්සන් කොටුවක් නිර්මානය කලේ ය. යුද්ධය පැන නැගීමට තුඩු දුන් ලෝක ධනේශ්වර ක්‍රමයේ කිසිදු පරස්පරවිරෝධයක් මෙමගින් විසඳුවේ නැත. අන්තර් අධිරාජ්‍යවාදී කාකොටාගැනීම් ගැඹුරු ද, උත්සන්න ද වූයේ ''සියලු යුද්ධ අවසන් කරන යුද්ධය'' අවසන්ව යන්තම් දශක දෙකකට පසුව දෙවැනි ලෝක යුද්ධය පුපුරා යෑමට මෙයින් මග පෑදී ය.

## යුද්ධයෙන් පසු නැවත ගොඩනැගීම

එක්සත් ජනපදය සතු දැවැන්ත සුපිරි ආර්ථික ශක්තියත් සිය ප්‍රතිවාදීන් මත එහි ආධිපත්‍යයේත් පදනම මත ලෝක ධනවාදී පර්යාය ප්‍රතිනිර්මානය කිරීමට අතගැසියහැකි තත්වයකට එරට පත්වූයේ, හුදෙක් දෙවැනි ලෝක සංග්‍රාමය අවසානයේ දී ජර්මනිය හා ජපානය පරාජය වීමත්, බ්‍රිතාන්‍ය හා එහි අධිරාජ්‍යය බරපතල ලෙස දුබලවීමත් හේතුවෙනි.

යුද්ධයෙන් පසු නැවත ගොඩ නැගීමේ අත්‍යාවශ්‍ය අංගය වූයේ ඇමරිකානු ධනවාදය විසින් සංවර්ධනය කල ඉහල නිෂ්පාදන ශිල්පක්‍රම අවශේෂ ලෝකයට පතුරුවාලිය හැකි සැකැස්මක් තහවුරු කිරීම ය.

1933 නොවැම්බරයේ දී රචිත ''ජාතිකවාදය හා ආර්ථික ජීවිතය'' නම් ට්‍රොට්ස්කිගේ සුප්‍රකට ලිපිය තුල ඔහු මෙම ප්‍රසාරනයේ ඓතිහාසික අවශ්‍යතාව පෙන්වා දුන්නේ ය. ප්‍රමිතිගත මහා පරිමාන නිෂ්පාදනය මගින් ඇමරිකානු ධනවාදය ශ්‍රම ඵලදායිතාවය නව ඉහලකට සංවර්ධනය කර තිබේ. මෙම ශිල්පක්‍රම අවශේෂ ලෝකය තුලට මාවතක් සාදා ගැනීමට නියමිතව තිබූ බැව් ඔහු ලිවී ය.

''එහෙත් පැරනි ලෝකය කනපිට පෙරලීම ප්‍රතික්ෂේප කරයි. හැමකෙක්ම අන් සියල්ලන්ගෙන් තමා ආරක්ෂා වන අතර තීරු බදු තාප්පයකින් ද බයිනෙත්තු වැටකින් ද තමා ආරක්ෂා වෙයි. යුරෝපය නය නොගෙවා, භාන්ඩ මිලට නොගෙන ඊට අමතරව ආයුධවලින් ද සන්නද්ධ වන්නී ය. සාගත ජපානය මුස්පේන්තු සේනාංක පහක් සහිතව ගොස් මුලු රටක්ම අල්ලාගනියි. ලෝකයේ අති නවීන තාක්ෂනය හදිසියේ ම බොහෝ පහත් තාක්ෂනය මත පදනම් වූ බාධකයන් හමුවේ නිෂ්ක්‍රීය බවක් පෙන්වයි. ශ්‍රම ඵලදායිතාවයේ නියාමය එහි බලයෙන් තොර බවක් පෙනී යයි.''

''එහෙත් එය එසේ යයි පෙනීයනවා පමනකි. මනුෂ්‍ය ඉතිහාසයේ මූලික නියාමය, ව්‍යුත්පන්නයෙන් හා ද්වීතීයික සංසිද්ධියෙන් නොවැරදීම එහි පලිය ගත යුතු ය. ඉක්මනින් ම හෝ කල් පසු වී ඇමරිකානු ධනවාදය ඒ සඳහා මංපෙත් අපගේ ග්‍රහලෝකයෙහි දිගට හරහට විවර කර ගත යුතු ය. කුමන ක්‍රමවේදයන්ගෙන් ද? සියලු ක්‍රමවේදයන්ගෙනි. ඵලදායිතාවයේ ඉහල සංගුනකය, විනාශකාරී බලයේ ඉහල සංගුනකය ද ඇඟවුම් කරයි. මම යුද්ධය දෙසන්නෙම් ද? යාන්තමින් හෝ නැත. මම කිසිවක්ම දේශනා නො කරමි. මම ආර්ථික යාන්ත්‍රනයේ නියාමයන්ගෙන් ලෝක තත්වය විශ්ලේෂනය කොට නිගමනයන් උපුටාගැනීමට උත්සාහ කරනවා පමනි. [*Trotsky, "Nationalism and Economic life" in Writing 1933-34*, (ජාතිකවාදය හා ආර්ථික ජීවිතය - ට්‍රොට්ස්කිගේ ලියවිලි, 1933-34), පිටු 161 හා 62]

මාර්ෂල් සැලැස්ම යුරෝපයට ඩොලර් බිලියන 13ක ආධාර සම්පාදනය කලේ ය. ආධාර අත්‍යවශ්‍ය වුවත් එය ප්‍රාග්ධනයේ ස්වයං ප්‍රසාරනය ඇතිකලහැක්කා වූ රාමුවක් තුල ස්ථානගත කල යුතු විය. බ්‍රෙට්න්වුඩ්ස් සම්මුතීන්, ජාත්‍යන්තර වෙලඳාමේ පලල්වීම සඳහා මාධ්‍යයන් සම්පාදනය කලාවූ, රන් අවුන්සය ඩොලර් 35 යන අනුපාතය මගින් පිටුබලය දුන්, ප්‍රධාන ජාත්‍යන්තර මුදල ලෙස ඩොලරය පිහිටුවාලී ය. එහෙත් එය එපමනකට ම සෑහුනේ නැත. යුරෝපා ආර්ථිකය වඩාත් ඵලදායී තැනකට ගෙන ආයුතු විය.

මාර්ෂල් සැලැස්මේ වැදගත්කම පැවතියේ එය සම්පාදනය කල ආධාර මතම නොව, එහි ඇමරිකානු සැලසුම්කරුවන් යුරෝපා ආර්ථිකය සමස්තයක් ලෙස ප්‍රතිනිර්මානය කල යුතු බවට කල අවධාරනය තුල ය. පූර්ව අවධිය නියෝජනය කල සීමාවන්, සම්බාධක හා සම්මේලන (වෙලඳ) අවසන් කල යුතු විය. මෙම පියවරයන් මත පමනක් ඇමරිකානු ශිල්පක්‍රම මත පදනම් වූ මහා පරිමාන නිෂ්පාදනය පිහිටුවා ලිය හැකි විය.

ප්‍රධාන ප්‍රශ්නය වූයේ ප්‍රාග්ධනයේ ස්වයං ප්‍රසාරනය ප්‍රකෘතිමත් කල හැක්කේ කෙසේ ද යන්න යි. මෙම ක්‍රියාවලිය රඳා පවතින්නේ ලාභානුපාතිකය ඉහල නැංවීමට හෝ අවම වසයෙන් පවත්වාගැනීමට වත් සෑහෙන අනුපාතයකින් අතිරික්ත වටිනාකම් නිරතුරුව සමුච්ඡය වීම මත ය. ඉහල නැගි ලාභය නව ආයෝජනයන් සඳහා මාධ්‍ය සම්පාදනය කරයිඃ නව ආයෝජනයන් යනු බහුල ශ්‍රම රැකියා නියුක්තිය හා පාරිභෝගික භාන්ඩ වෙලඳපොල ප්‍රසාරනය ද එබැවින් සමස්ත ක්‍රියාවලියට ඉන්ධන සපයන අතිරේක ලාභ හා ආයෝජනයන් සඳහා තව දුරටත් අවස්ථාවන් ය. එය සිදු නොවන්නේ නම් අපට ඇත්තේ ආපස්සට යෑම යඃ වෙලඳපොලවල් හැකිලී යෑම, වර්ධනය වන ගැටුම්, වෙලඳ සම්බාධක හා කාන්ඩ ගැසීම ය.

අවසාන විග්‍රහයේ දී, ට්‍රොට්ස්කි කියා ඇති ධනේශ්වර සංවර්ධනයේ වක්‍රයෙහි නැඹුරුවීම් හා ප්‍රවනතාවන් තීරනය කරන්නා වූ යටින් වැටී ඇති බලය වන්නේ සාමාන්‍ය ලාභානුපාතයේ හැසිරීම යි. ප්‍රථම ලෝක සංග්‍රාමය පැන නැගීම, ධනේශ්වර ක්‍රමයේ ප්‍රධාන හැරීම් ලක්ෂ්‍යයක් ලෙස ට්‍රොට්ස්කි සටහන් කලේ ය. 1890 ගනන් මැදභාගයේ පටන්ගත් ඉහල නැගීම අවපාතයකට හැරවුනේ ලාභය පහල වැටීම හා හැකිලුනු වෙලඳපොලවල අවධියක් ආරම්භ කරමින් ය. යුරෝපයේ නිෂ්පාදන මට්ටම් 1913 මට්ටම් කරා ලඟාවීමට, එදිරිවාදිකම් අවසන් කිරීමෙන් පසුව, තවත් දශකයක්ම ගත විය. එය ද මහා අවපාතය ආරම්භ වීමට මඳකට පෙර ය. සෑම ධනේශ්වර මහ බලවතෙකුම, සිය අධිරාජ්‍ය, තමා සඳහාම කපා වෙන් කර ගැනීමට උත්සාහ කිරීමේ දී හටගත් ගැටුම් මාලාවකින්, 1930 ගනන් සංලක්ෂිත විය. බ්‍රිතාන්‍ය සිය අධිරාජ්‍යය මත පදනම් වෙමින් සීමාකාරී වෙලඳ ගිවිසුම් ඇතිකරගත් අතර ජපානය නැගෙනහිර කලාපයක් ඇති කිරීමට මාන බැලුවේ, ජර්මානු අධිරාජ්‍යවාදය නැගෙනහිර ලෙබන්ස්රෝම් අත්කර ගැනීමට මෙහෙයවුනු අතරතුර ය.

ඇමරිකානු සමාගම් සඳහා නව අවස්ථාවක් විවර කලා වූ ද, එහි වඩාත් ඵලදායී ශිල්පීය ක්‍රම යුරෝපයේ, ජපානයේ හා වෙනත් තැන්වලට යෙදීම මත පදනම් වීගෙන යුද්ධයෙන් පසු නැවත ගොඩ නැගීම බාරගත් ඇමරිකාව එමගින් ප්‍රාග්ධන ප්‍රතිනිෂ්පාදනයේ ප්‍රසාරනය සහතික කලේ ය. අතිරික්ත වටිනාකම් සමුච්ඡයේ වැඩිවීම ද, ලාභානුපාතිකයේ ඉහල නැගීම ද, පශ්චාත් යුද්ධ උත්පාතයට පදනම සැකසීය. පද්ධතිය සමස්තයක් ලෙස රැකගැනීමට, ඇමරිකාවේ දැවැන්ත ප්‍රාග්ධන සම්පත් සමත් විය.

## බ්‍රෙට්න්වුඩ්ස්හි බිඳවැටීම

එහෙත් යුද්ධයෙන් පසු නැවත ගොඩනැගීම ධනේශ්වර ආර්ථික නියාමයන් ජය ගත්තේ නැත. බ්‍රෙට්න්වුඩ්ස් මුල්‍ය ක්‍රමය මුල්බැස්සවා තිබූ එක්සත් ජනපද ආර්ථිකයේ, මහා සාපේක්ෂ හා පරම ආධිපත්‍යයට, යලි නැගී සිටි යුරෝපීය බලයන්, යටින් වලකැපී ය. තවද යුද්ධයෙන් පසු නැවත ගොඩ නැගීම විකසිත කල නිෂ්පාදනයේ ප්‍රසාරනය, වෙලඳාම හා ආයෝජනවල අර්ථය වූයේ මුල්‍ය ක්‍රමය පදනම් කර තිබූ ජාතික මෙහෙයුම් ක්‍රමය සමග ප්‍රාග්ධනයේ වැඩෙන ගෝලීය ප්‍රසාරනය ගැටුමකට එලඹීම යි. එක්සත් ජනපදයේ සාපේක්ෂ දුබල වීම ද, ලෝක ආර්ථිකයේ ප්‍රසාරනය හා ජාතික ආර්ථික මෙහෙයුම අතර වර්ධනය වන ගැටුම යන දෙකෙහි ප්‍රකාශනය වූයේ බ්‍රෙට්න්වුඩ්ස්හි මලගමයි.

1971 දී එක්සත් ජනපද ඩොලරයට රත්රන්වලින් දී තිබුනු පිටුබලය අවසන් කරමින් නික්සන්, එක්සත් ජනපද විශිෂ්ඨත්වය පවත්වා ගැනීමට උත්සාහ කලේ ය. බ්‍රෙට්න්වුඩ්ස් ක්‍රමය තව දුරටත් පවත්වාගැනීමේ අර්ථය විය හැකිව තිබුනේ අවපාතය පූර්න වසයෙන් ස්ථිර පදනමකට ගෙන ඒම සහ / හෝ එක්සත් ජනපද ජාත්‍යන්තර වැය කිරීම් සඳහා දැඩි සීමාවන් ය. එම විකල්පය බැහැර කරනු ලැබිනි. නව ක්‍රමයට යුරෝපීයන් හරස් කපනු ඇති වුවත් ජාත්‍යන්තර මුදල් ඒකකයක් ලෙස ක්‍රියාකල හැකි වෙනත් මුදලක් නොවූ තතු තුල ඔවුන්ට ඩොලරය පිලිගැනීමට සිදුවිය.

ස්ථාවර මුදල් සම්බන්ධතාවයේ අවසානය ද ජාතික මුල්‍ය මෙහෙයුමේ අවසානය මෙන්ම ඉතාම බලගතු ජාතීන්ගේ හා ජාතීන්ගේ කන්ඩායම්වල ආර්ථිකයන් පවා අඟුටුමිට්ටන් බවට පත් කරන අද දින ගෝලීය මුල්‍ය වෙලඳපොලෙහි අනම්‍ය වූ නැගීම මෙමගින් නිවේදනය කලේ ය.

දත්ත කිහිපයකින් මෙය ප්‍රකාශ කරයි. 2001 හා 2004 අප්‍රේල් මාසයන් අතර විදේශ හුවමාරු වෙළඳපොලවල දෛනික ගෝලීය පිරිවැටුම ඩොලර් ට්‍රිලියන 1.9 ක් දක්වා සියයට 57 කින් ඉහල නැගුනු අතර සංකීර්න ව්‍යුත්පන්නයන්හි දෛනික පිරිවැටුම ඩොලර් ට්‍රිලියන 1.2ක් දක්වා සියයට 77කින් වර්ධනය විය. ජාත්‍යන්තර බේරුම්කාර බැංකුව ගනන් බැලුවේ ව්‍යුත්පන්න වෙළඳපොල වටිනාකම ඩොලර් ට්‍රිලියන 200ක් හෝ ගෝලීය දල දේශීය නිෂ්පාදිතයේ වටිනාකම මෙන් සය ගුනයක් පමන වන බවයි.

පශ්චාත් යුද්ධ උත්පාතයේ නිෂ්පාදන ප්‍රසාරනය බ්‍රෙට්න්වුඩ්ස් මූල්‍ය ක්‍රමය බිඳදැමුවා පමනක් නො වේ. එය ලාභානුපාතය පහල වැටීමේ ප්‍රවනතාවක් යලි පනගැන්වීමට ද මුල් විය. ධනවාදය 1974/75 පහල වැටීමෙන් ගොඩ ආ නමුදු ලාභානුපාතිකය පශ්චාත් යුද උත්පාතයේ මට්ටම් කරා ලඟා නො වී ය. ලාභානුපාතිකයන්ගේ නොකඩවා ඇතිවන පීඩනය හමුවේ විද්‍යාමාන වූ අති උද්ධමනයේ ප්‍රපංචය (ඉහල විරැකියාව හා ඉහල උද්ධමනය) 1970 ගනන් අගභාගයේ නිෂ්පාදන ක්‍රියාවලියේ ම දුරදිග යන වෙනස්කම් දිරිගැන්වී ය.

ප්‍රාග්ධනය නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිසංවිධානය ආරම්භ කරනු ලැබුවේ කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට පහර දීමත් සමග අත්වැල් බැඳගෙන ලාභානුපාතිකයේ පීඩනය ජය ගැනීමට ද අතිරික්ත වටිනාකම් සමුච්ඡ ඉහල නංවා ගැනීමට උත්සාහ කිරීම සඳහාත් ය. මෙම පරිවර්තනයේ ප්‍රතිඵලය වූයේ නිෂ්පාදනයේ සියලු අංශ භූගෝලීයකරනය වීම ද ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක් තුල ම පරිඝනක තාක්ෂනය යොදාගැනීමත් ය.

මෙම වෙනස්කම් 20වැනි සියවසේ ආරම්භක දශකයන්හි දී පිරිද්දුම් පේළි නිෂ්පාදනය සමග ඇති වූ සංවර්ධනය තරම්ම දුරදිග යන ඒවා බවට කිසිදු සැකයක් නැත.

එහෙත් එක් මූලික වෙනස්කමක් ඇතඃ නවීන හා සුවිසල් නිෂ්පාදන ශිල්පික්‍රම පලුල් ලෙස භාවිතා කිරීම තිබිය දී ම ධනවාදය, ප්‍රසාරනය වූ ප්‍රතිනිෂ්පාදනයේ අවධියක ප්‍රීතිය භුක්ති නොවිඳින අතර එය දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ඇති වූ අන්දමේ ප්‍රසාරනයකට ඉඩ ප්‍රස්ථාව සැලසූ සාමාන්‍ය ලාභානුපාතිකය ඉහල නංවනු ලැබූ අතිරික්ත වටිනාකමේ එන්ට එන්ටම විශාල වන සමුච්ඡය වීමක් නො වේ.

ඊට විපරීතව සමස්තයක් ලෙස ලෝක ආර්ථිකය මන්දගාමී වර්ධනයෙන් හා මුලුමනින් ම එක තැන පල්වීමෙන් අංගලක්ෂිත වේ. එක්සත් ජනපදයේ ආර්ථික පහලවැටීම ද, යුරෝපයේ පහත් වර්ධනය ද, ජපානයේ ඉඩම් මිලෙහි පිම්බුනු බුබුල හා කොටස් වෙළඳපොල බිඳවැටීම හමුවේ, 1990 ගනන් ප්‍රථම භාගයේ වැඩි වර්ධනයෙහි ප්‍රධාන මූලාශ්‍රය වූයේ ''ආසියානු ආර්ථික ප්‍රාතිහාර්යය යි.'' 1997-98 අර්බුදයට සමගාමීව ඇතිවූ අතිරේක වර්ධනයේ ප්‍රධාන මූලය වූයේ එක්සත් ජනපද ආර්ථිකය යි. නිදසුනක් ලෙස 1995-2002 අතර ලෝක නිෂ්පාදිතයෙන් සියයට 30 ක් ද, ලෝක දල දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 98ක් පමන ද නියෝජනය කලේ එක්සත් ජනපදය බවට ගනන් බලා තිබේ. එනම් එම කාලය තුල ලෝකයේ අවශේෂ සියයට 70 නිෂ්පාදනය කලේ ද.දේ.නි. වර්ධනයෙන් සියයට දෙකක් පමනක් බවයි.

## පහසු මුදල් පිලිවෙත

පසුගිය විසිවසරේ ලෝක ආර්ථිකය හෝ 1987 ඔක්තෝබරයේ කොටස් වෙළඳපොල බිඳවැටීමේ පටන් කාලවකවානුව යමෙකු විමසා බලන්නේ නම්, වර්ධනයේ ගාමකය පශ්චාත් යුද උත්පාතයේ දී මෙන් ප්‍රසාරනය වන ලාභයෙන් නිෂ්පන්න නොවූ බවත්, මූල්‍ය ද්‍රවශීලතාව නොකඩවා එන්නත් කිරීමෙන් අත් කර ගත් බවත් පැහැදිලි වනු ඇත.

1987 කොටස් මිල කඩාවැටීමට ෆෙඩරල් රිසර්ව් මන්ඩලයේ ප්‍රතිචාරය වූයේ මූල්‍ය ඇබය ගලවා දැමීමයි. 1930 ගනන් පුනර්කරනයක් සිදු නොවනු ඇත. එහි එක් ප්‍රතිඵලයක් වූයේ (ඇමරිකානු මූල්‍ය ප්‍රතිපත්තියේ) ජපානය යලි ගොඩ නො ආ අවධමනයේ හා පල්වීමේ අවධියකට තල්ලු කරමින්, 1990 ගනන් මුල දී අවසන් වසයෙන් බිඳවැටුනු කොටස් හා ඉඩම් මිලේ පිම්බූ බුබුලක් නිර්මානය වීමයි.

පහසු මුදල් පිලිවෙතක් අනුගමනය කිරීමෙන් පසුව 1994 දී මන්ඩලය පොලී අනුපාත ඉඩි කිරීමට නැඹුරු විය. මෙය එක්සත් ජනපදය තුල නය-බැඳුම්කර වෙළඳපොලෙහි අර්බුදයකට මුලපිරී ය. ''අතාර්කික ප්‍රීතෝන්මාදය'' පිලිබඳ ග්‍රීන්ස්පෑන්ගේ දූන් සුපතල ප්‍රකාශය සිහිගන්වමින්, ද්‍රවශීලතාව එන්නත් කිරීමක්, කොටස් වෙළඳපොලට සැලකිය යුතු දිරිගැන්වීමක් සම්පාදනය කලේ ය. එහෙත් මන්ඩලයේ සභාපති, පිම්බෙන බුබුලෙහි හුලං බැස්සවීමට කිසිවක් නො කලේ ය. ඒ වෙනුවට ඔහු, ඵලදායිතාවයේ ඉමහත් වර්ධනය හා නිදහස් වෙළඳපොලේ ආශ්චර්යයෙහි තේරුම, ව්‍යාපාර චක්‍රයෙහි ක්‍රියාකාරිත්වය තව දුරටත් එක්සත් ජනපද ආර්ථිකය මත බල නොපවත්වන්නේ ය යන්න දරා සිටින ''නව ආර්ථිකය'' පිලිබඳ න්‍යායේ ගුරා බවට පත් විය.

1997-98 ආසියානු අර්බුදයත් සමග, එක්සත් ජනපද මූල්‍ය වෙළඳපොල සුරක්ෂිත කෙම්බිමක් ලෙස දුටු ප්‍රාග්ධනය එය වෙත ඇදෙන්නට විය. නමුත්, මූල්‍ය දියවී යාමෙන් වැළැක්වීම සඳහා ඩොලර් බිලියන තුනක ඇපයක් ආවශ්‍යක වූ දිගු කාලීන ප්‍රාග්ධන කලමනාකරනයේ අර්බුදයක් 1998 සැප්තැම්බර්-

ඔක්තෝබර් මාසවල දී ජනනය වීමත් සමග විය යුතු පරිද්දෙන් ම ප්‍රශ්නය නැවත මතු විය. 2001 කොටස් වෙළඳපොල ලුහුටායාමට මන්ඩලය ප්‍රතිචාර දක්වූයේ, තව දුරටත් පොලී අනුපාතිකයන් කපා හරිමින් ය. එහෙත් මෙය, හුදෙක් තුඩු දුන්නේ දේපල හා නය බුබුලක් නිර්මානය කිරීමට ය.

මෙම ක්‍රියාවලිය අවසාන වන්නේ කොතැනින් ද? යම් කාලයකට මිනිස් සිරුර, එන්නත් හා ඇඩ්‍රිනලින් හෝමෝන මගින් ක්‍රියාත්මකව පවත්වා ගත හැකි බව අපි දන්නෙමු. එහෙත් ක්‍රියාවලිය පවත්වා ගෙන යන කාලය දිගු වන විට වැඩි වැඩියෙන් එන්නත් කිරීමට අවශ්‍ය වන අතර අවසානයේ දී ශරීරය ඇද වැටෙයි. මූල්‍ය ද්‍රවශීලතාවෙන් සැබෑ ආර්ථිකයට දිරි ගැන්වීමක් සැපයිය හැකි වුවත්, සීමාවන් පවතින අතර, ඒවා වේගයෙන් ලඟාවන බවට අනතුරු ඇඟවීම් ද පවතී.

ඔඩේ ඇසට් මැනේජ්මන්ට් නම් සුරැකුම් අරමුදල් සමූහය මගින් සකස්කල වාර්තාවක ලිපියක් ජනවාරි 24 දින *ෆයිනෑන්ශල් ටයිම්ස්* හි පල කරන ලදී. මෑත වසරවල එක්සත් ජනපදය හා මහා බ්‍රිතාන්‍යය යන දෙරටේ නය බරෙහි ඉහල යෑම එක්කෝ අවධමනයකින් නැත හොත් අත්‍යසාමාන උද්ධමනයකින් කෙලවර වීමේ අන්තරාය ගෙන එන ''ව්‍යාජ සෞභාග්‍යය'' පිලිබඳව එහි සඳහන් විය. ''ලිහිල් නය ප්‍රතිපත්තිය පාරිභෝගික මිල උද්ධමනය තුල දැකිය නොහැකිව ඇතත් සුලු වත්කම් කොටසක් හඹා යන පමනට වැඩි මුදල් සම්භාරයක් සහිත වත්කම් මිලෙහි දැකිය හැක. අවසානයේදී නය බුබුල ශබ්ද නගා පුපුරා යන්නේ එක් අතකින් නය බර අඩු කිරීම සඳහා මූල්‍ය අධිකාරීන් මූල්‍ය වෙලඳපොලට තවතවත් ද්‍රවශීලතාව පොම්ප කරද්දී උද්ධමනය ද, හෝ අනෙක් අතට නය බර දරා ගැනීම සඳහා තව තවත් නය ප්‍රමානයන් වත්කම් බුබුල් විසින් කැඳවුම් කෙරෙන අතර එහිදී නයකරුවන් ගෙවීම් පැහැරහැරීමෙන් අවධමනය ද හෝ ඇතිවිය හැකි නිසා ය.''

නයෙහි පුලුල් වීමේ ප්‍රතිඵලය වසයෙන් එක්සත් ජනපදයේ මූල්‍ය තත්වයේ හට ගෙන ඇති යෝධ අසමතුලිතතාවය එක්සත් ජනපද සසප රැස්වීමට ඩේවිඩ් නෝර්ත් පැහැදිලි කලේ ය. ඉන් එකක් ඉස්මතු කිරීමට මට ඉඩ දෙන්න. එක්සත් ජනපදයේ ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්වය (එන්.අයි.අයි.පී) 1997 දී සෘන ඩොලර් බිලියන 360ක සිට 2003 දී සෘන ඩොලර් ට්‍රිලියන 2.65 දක්වා පහත වැටුනු අතර එය 2004 දී සෘන ඩොලර් ට්‍රිලියන 3.3 දක්වා වැටෙනු ඇතැයි බලාපොරොත්තු වේ. මෙය එක්සත් ජනපද ද.දේ.නි.යෙන් සියයට 24ක පංගුවකි. කෙසේ වුවද ජංගම ගිනුමේ හිඟය වත්මන් මට්ටමේ ම පැවතුන හොත් හා කොංග්‍රස් අයවැය කාර්යාලයේ පුරෝකථනය කල ද.දේ.නි. වර්ධන අනුපාතය එසේ පවතී යයි සැලකුව හොත් ඉදිරි දශකය තුල එන්.අයි.අයි.පී.ය ද.දේ.නි.යෙන් සියයට සෘන 64ක් දක්වා වැඩෙනු ඇත. සමරූපීව නය සේවා සඳහා ගෙවීම් දැනට පවතින ශූන්‍ය මට්ටමේ සිට ද.දේ.නි. සියයට 1.7 පමන දක්වා ඉහල යනු ඇත.

එක්සත් ජනපදය පිටත ලෝකයෙන් ගලා එන මූල්‍ය සම්පත් මත රඳා පැවතීම සමහර මූල්‍ය කවයන් තුල කනස්සල්ලට හේතු වී තිබේ. පසුගිය ඔක්තෝබරයේ දී එක්සත් ජනපද හිටපු භාන්ඩාගාර ලේකම් ලෝරන්ස් සමර්ස් පැවැත්වූ දේශනයක දී ප්‍රාග්ධන ගලා ඒම් එක්සත් ජනපද ආර්ථිකයේ ශක්තිය අඟවන බවට කෙරෙන ප්‍රකාශ ප්‍රතික්ෂේප කලේ ''එක්සත් ජනපද ජංගම ගිනුමේ හිඟයෙන් විශාල පදාසයක් විදේශ මධ්‍යම බැංකු මැදිහත් වීමෙන් කෙරෙන මූල්‍ය සම්පාදනයෙන් පියවාගත්තා වූ මූලික චිත්‍රය පිලිබඳව කිසිවෙකුටත් වාද කල නොහැකි'' බව පවසමින් ය.

මෙ ලෙස ''කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතාවන් සඳහා විදේශීය ආන්ඩු මත රඳා පැවතීම ආර්ථික හා දේශපාලන විෂයපථයන් දෙකෙහි ම ප්‍රශ්න මතුවීමටත් අවදානම් නිර්මානය වීමටත් තුඩු දෙයි. සාධාරන ලෙස ප්‍රශ්නය මෙසේ නැගිය හැකියඃ ලෝකයේ බලගතුම නය ගැතියාට ලෝකයේ ලොකුම නය ගැනුම්කරුවා ලෙස කොතෙක් කල් පැවතිය හැකි ද? කොතෙක් කල් අධිරාජ්‍යයට ක්‍රෙඩිට් කාඩ් මත වියදම් කල හැකි දැයි අපට ඇසීමට පුලුවන.''

සමර්ස් කියා ඇති පරිදි ''මූල්‍ය ත්‍රස්තයේ තුලනය'' හේතුවෙන් තත්වය මේ තාක් දුරට ස්ථාවරව පවතී. එනම්, ආසියානු හා අනෙකුත් මධ්‍යම බැංකු හදිසියේ ම එක්සත් ජනපදයේ මූල්‍ය වෙලඳපොලෙන් අරමුදල් ඉවත් කල හොත් ඩොලරයේ අගය වැටීමේ ප්‍රතිඵල වසයෙන් ඔවුන්ට ම දැවැන්ත පාඩු විඳීමට සිදුවනු ඇත. එහෙත් එවන් පියවරයන් දැනට මත් ගනිමින් තිබෙන බවට සාක්ෂි තිබේ.

*ෆයිනෑන්ෂියල් ටයිම්ස්* පුවත්පත වාර්තා කලේ ''බුෂ් පරිපාලනයේ පිම්බෙන ජංගම ගිනුම් හිඟය පියවාගැනීමේ දුෂ්කරතාවන් උග්‍ර කල හැකි පියවරක්'' ලෙස එකී මධ්‍යම බැංකු සිය සංචිත එක්සත් ජනපදය වෙතින් යුරෝ කලාපයට මාරු කරමින් සිටින බවයි. එම ලිපිය පදනම්ව ඇත්තේ පසුගිය දෙවසර තුල මධ්‍යම බැංකු සංචිත කලමනාකරුවන් ගෙන් සියයට හැත්තෑවක් යුරෝ මුදලට ඔවුන්ගේ නිරාවරනය වීම ඉහල දමා ඇති බව පෙන්වා දුන් සමීක්ෂනයක් මත ය. තවත් වාර්තාවක් සඳහන් කලේ තිල දත්ත ලබා ගත හැකි නවතම වසර වන 2003 දී ලෝකය වටා මධ්‍යම බැංකු එක්සත් ජනපදයේ ජංගම ගිනුමේ හිඟයෙන් සියයට 83ක් සඳහා මුදල් සම්පාදනය කල අතර එයිනුත් සියයට 86ක් ම ගලා ආවේ ආසියානු මධ්‍යම බැංකුවලින් බවත් ය.

*ෆයිනෑන්ෂල් ටයිම්ස්* වාර්තාව පලවීමේ කාල වකවානුව හා ඊට දී ඇති තැනෙන් ගම්‍යවන දේශපාලන වැදගත්කම නොවරදින සුලු ය. එය දිස්වූයේ ජනවාරි 24 වන දින මුල්පිටුවේ ප්‍රධාන පුවත ලෙස ''මධ්‍යම බැංකු එක්සත් ජනපදයෙන් ඉවතට හැරේ'' යන සිරස්තලය යටතේ බුෂ්ගේ පදවි ප්‍රාප්ති කථාවෙන් දින කිහිපයකට පසුව ය.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org